සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 08 | විෂයය / பாடம் / Subject | ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | I,II | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

නම :- ........................................................................ විභාග අංකය :- ....................

Learning Resource Center R De Mazenod College Kandana

I කොටස

සැලකිය යුතුයි:
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා එම පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) පහළොස්වන සියවස අගභාගයේ දී උඩරට රාජධානිය පිහිටුවා ලීමට සමත් වූ පුද්ගලයා කවුරුන් ද?
(1) ජෝතිය සිටු (2) අම්බුලුගල කුමාරයා
(3) සේනා සම්මත වික්‍රමබාහු (4) වීරසුන්දර බණ්ඩාර

(02) පෘතුගීසීන්ට එරෙහිව සටන්කොට, පළමුවන විමලධර්මසූරිය නමින් උඩරට රජ බවට පත් වූයේ,
(1) යමසිංහ බණ්ඩාරය (2) කොනප්පු බණ්ඩාරය
(3) වීරසුන්දර බණ්ඩාරය (4) නිකපිටියේ බණ්ඩාරය

(03) උඩරට රාජධානියේ බලයට පත් වූ නායක්කර් රජවරු අතර දැකිය හැකි සුවිශේෂී ලක්ෂණය වන්නේ,
(1) ඔව්හු බෞද්ධාගමට විරුද්ධව කටයුතු කළහ.
(2) බෞද්ධ කුල කාන්තාවන් විවාහය සඳහා තෝරාගත්හ.
(3) බුදු දහම වැළඳගනිමින් බුද්ධාගමේ උන්නතිය වෙනුවෙන් කටයුතු කළහ.
(4) හැකි සෑම විටම හින්දු ආගම ව්‍යාප්ත කිරීමට කටයුතු කළහ.

(04) ක්‍රි. ව. 1507 දී පෙරදිග පෘතුගීසි බල ප්‍රදේශවල පාලකයා ලෙස වෙළෙඳ බලය තහවුරු කර ගත්තේ,
(1) ලොරෙන්සෝද අල්මේදාය (2) ප්‍රැන්සිස්කෝ ද අල්මේදාය
(3) වස්කෝද ගාමාය (4) ඇල්බුකර්ක් නැමැත්තාය

(05) පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට කෝට්ටේ රාජධානියේ පැවති දේශපාලන ස්වභාවය නිවැරදිව දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
(1) විශාලතම මෙන්ම බල සම්පන්නම රාජ්‍යය විය.
(2) රාජ්‍යය කොටස් තුනකට බෙදී පැවතුනි.
(3) වන්නි රාජ්‍යය පැවති අතර ඒවා ස්වාධීන පාලන ඒකක විය.
(4) ආහාර අතින් ස්වයංපෝෂිත වූ අතර ධනවත්ම පාලන ඒකකය විය.

(06) පළමුවන රාජසිංහ රජුගේ පෘතුගීසීන් පලවා හැරීමේ ප්‍රයත්නය අසාර්ථක වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද?
(1) මායාදුන්නේ රජුගේ අභාවය නිසා රාජසිංහ රජු අධෛර්යමත්වීම.
(2) ගෝවෙන් ආධාර ලැබීම නිසා පෘතුගීසීන් ශක්තිමත් වීම.
(3) දේශීය ජනතාව පෘතුගීසීන්ගේ සහාය පැතීම.
(4) රජු සිව ආගම වැළඳගෙන බෞද්ධ විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.

(07) කතෝලික ආගම වැළඳගත් අයට එය අත්හරින ලෙසත් එම නියෝගය නොපිළිපදින අයට මරණ දඬුවම ලබාදෙන ලෙසත් නියම කළ යාපන පාලකයා කවුරුන්ද?
(1) පරරාජසේකරම්ය (2) සංකිලිය
(3) චේගරාජසේකරම්ය (4) පුව්රාජ පණ්ඩාරම්ය

(08) බෞද්ධ විහාර හා හින්දු කෝවිල් සතු දේපළ කතෝලික පල්ලියට ලබාදුන් පාලකයා කවුරුන් ද?
(1) ධර්මපාල රජු (2) පරරාජසේකරම් රජු
(3) හත්වන බුවනෙකබාහු රජු (4) පුව්රාජ පණ්ඩාරම් රජු

(09) අනිසි හැසිරීම නිසා උඩරට රාජධානියේ රාජ පුරුෂයන් අතින් ජීවිතක්ෂයට පත් වූ ලන්දේසි දූත පිරිසේ නායකයා,
(1) සී. බෝල්ට්ද වාර්ට් ය. (2) ජොරිස් ෆන් ස්පිල් බර්ජන් ය.
(3) විලියම් හෙන්ද්‍රික්ද බීවර් ය. (4) ෆන් හුන්ස් ය.

(10) මඩකලපුව, පුත්තලම ප්‍රදේශවල සිටි දෙමළ භාෂාව කථා කරන ජනතාව අතර භාවිතා වූ නීති හැඳින්වූයේ,
(1) තේසවලාමෙ නීතියයි. (2) රෝම ලන්දේසි නීතියයි.
(3) මහම්මද් නීතියයි. (4) මුක්කුවාර් නීතියයි.

(11) මිනිසා පව්කාරයකු ලෙසත් දෙවියන් උසස් කොටත් සැලකීම සිදු වූයේ,
(1) පුනරුද යුගයේ දී ය. (2) නූතන යුගයේ දී ය.
(3) මධ්‍යතන යුගයේ දී ය. (4) පුරාතන යුගයේ දී ය.

(12) ක්‍රි. ව. 1765 දී එංගලන්තය ජනපද වාසීන්ගෙන් අයකළ බදු වර්ග අතර ඉතා පීඩාකාරීම බදු වර්ගය වූයේ,
(1) තේ බද්ද ය. (2) මුද්දර බද්ද ය.
(3) කඩදාසි බද්ද ය. (4) වීදුරු බද්ද ය.

(13) ක්‍රි. ව. 1787 සකස් කරගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඇමරිකා එක්සත් ජනපදයට පත්වූ පළමුවන අගමැතිවරයා,
(1) ජෝර්ජ් වොෂිංටන්ය. (2) ජෝර්ජ් බුෂ්ය.
(3) ෆැන්ක්ලින් රූස්වෙල්ට්ය. (4) ජෝර්ජ් මැඩිසන්ය.

(14) ඇමෙරිකාව හෙවත් නව ලෝකය සොයා ගැනීමේ ගෞරවය හිමිවන්නේ,
(1) ඇමරිගෝ වෙස්පුචිටය. (2) කොලොම්බස්ටය.
(3) වස්කෝද ගාමාටය. (4) පර්ඩිනන්ඩ් මැගලන්ටය.

(15) ප්‍රංශ විප්ලවය ප්‍රංශයේ පමණක් නොව ලෝකවාසී ජනතාවගේ ද ජයග්‍රහණයක් බව සනාථ කරන ප්‍රකාශය තෝරන්න.
(1) ක්‍රි. ව. 1791දී මානව හිමිකම් පිළිබඳ ප්‍රකාශය නිකුත් කිරීම.
(2) සාම්ප්‍රදායික රාජාණ්ඩුව බිඳ වැටී සංවිධානාත්මක මධ්‍යම ආණ්ඩුවක් පිහිටුවීම.
(3) රදළයින්ගේ ඉඩම් අල්ලාගත් සුළු ගොවි පන්තියක් බිහි වීම.
(4) වැඩවසම් සමාජ සංවිධාන බිඳ වැටීම.

(16) ඇමෙරිකාවේ ජනපද පිහිටුවීමට මුල්වූ යුරෝපා ජාතියක් නොවන්නේ,
(1) ස්පාඤ්ඤ ය. (2) ලන්දේසි ය.
(3) ප්‍රංශ ය. (4) පෘතුගීසි ය.

(17) පහත A තීරුවට ගැළපෙන පිළිතුර B තීරුවෙන් තෝරන්න.

| | A | | B |
|---|---|---|---|
| 1. | ජෝන් ලොගී බෙයාර්ඩ් | A. | මෝටර් රථය |
| 2. | ඩෙම්ලර් | B. | ගුවන් විදුලිය |
| 3. | ගුග්ලි එල්මෝ මාර්කෝනි | C. | දුරේක්ෂය |
| 4. | ගැලීලියෝ ගැලලි | D. | රූපවාහිනිය |

(1) DABC (2) BDAC (3) ADBC (4) DBCA

(18) A හා B තීරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| | A | | B |
|---|---|---|---|
| 1. | තාරකා විද්‍යාවේ පියා | A. | නිකලස් කොපර්නිකස් |
| 2. | මානව විද්‍යාවේ පියා | B. | ගැලීලියෝ ගැලිලි |
| 3. | ඉතාලි සාහිත්‍යයේ පියා | C. | අලගියරි ඩාන්ටේ |
| 4. | අත්හදා බැලීමේ පියා | D. | ප්‍රැන්සිස් පෙට්රාක් |

(1) ADCB (2) DCAB (3) BADC (4) ACBD

(19) ප්‍රවාහන හා සන්නිවේදන ක්ෂේත්‍රයට නව නිපැයුම් එකතු කරමින් කාර්මික විප්ලවයට දායක වූ පුද්ගලයන් අනුපිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.

(1) ජේම්ස් හාග්‍රීව්ස් - ජෝන් කේ (2) ජෝන් ලොගි බෙයාර්ඩ් - ඒබ්‍රහම් ඩාබි
(3) හෙන්රිබෙල් - සැමුවෙල් මෝර්ස් (4) සැමුවෙල් ක්‍රොම්ප්ටන් - රොබට් ෆුල්ටන්

(20) කාර්මික විප්ලවයේ බලපෑම නිසා සමාජය තුළ ඇති වූ ප්‍රබල ප්‍රතිඵලයක් දක්වෙන පිළිතුර කුමක් ද?

(1) බැංකු රක්ෂණ වැනි මූල්‍ය ආයතන බිහිවීම.
(2) ගැමියන් නගර කරා ඇදී ඒමෙන් නාගරීකරණය සිදුවීම.
(3) නිෂ්පාදනය මහා පරිමාණ මට්ටමින් සිදුවීම.
(4) කම්කරුවන් හා ධනපතියන් වශයෙන් පන්ති බිහිවීම.

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවිය යුතු මුලු ප්‍රශ්න සංඛ්‍යාව 5කි.**

(01) තුන්වන වාරය සඳහා ඔබ පන්ති කාමරයේ දී ඉතිහාසය විෂයය සම්බන්ධයෙන් සිදුකල ඇගයීම් ක්‍රියාවලිය ඇසුරින් පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) තුන්වන වාරය සඳහා සිදුකළ ඇගයීම කුමක් ද? (ලකුණු 02)
(ii) ඒ සඳහා යොදා ගත් විෂයය ඒකකය හා ඔබ කණ්ඩායමට ලැබුණු අනු ඒකකයේ නම සඳහන් කරන්න. (ලකුණු 02)
(iii) මෙම ක්‍රියාකාරකමට තොරතුරු ලබාගත් මූලාශ්‍රය දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(iv) ක්‍රියාකාරකම සඳහා යොදාගත් පිත්තුර දෙකක නම් ලියන්න. (ලකුණු 02)
(v) ක්‍රියාකාරකම සඳහා විෂයභාර ගුරුතුමා/ තුමිය/ කණ්ඩායම් නායකයා, ඔබට ලබාදුන් උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 04)
(iv) ඇගයීම් ක්‍රියාකාරම තුළින් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(මුලු ලකුණු 16)

(02) (i) උඩරට රාජධානියට අයත් පහත සඳහන් ප්‍රදේශ ප්‍රසිද්ධ වූයේ කුමන කර්මාන්ත වලටදැයි අනුපිළිවෙලින් ලියන්න.

A ඇම්බැක්ක -

B මැද දුම්බර - (ලකුණු 02)

(ii) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු රදළයින්ගේ බලය මැඩලීමට ගත් ක්‍රියාමාර්ග 4ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) උඩරට රාජධානියේ රජවරු බෞද්ධාගමික දියුණුවට කටයුතු කළ ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) පෘතුගීසීන් හා උඩරට රජවරු අතර සටන් සිදුවූ ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) කෝට්ටේ රාජ්‍යය තුළ තම බලය පිහිටුවා ගැනීමට පෘතුගිසීන්ට පහසුවීමට බලපෑ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පෘතුගීසීන්ට උඩරට රාජ්‍යය යටත්කර ගැනීමට නොහැකි වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(04) (i) ලන්දේසීන්ගේ උසාවි වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ලන්දේසීන්ට එරෙහිව කටයුතු කළ උඩරට රජවරු හතර දෙනෙකු නම් කරන්න. (ලකුණු 04)

(iii) දේශීය ආර්ථිකය නගා සිටුවීමට ලන්දේසීන් අනුගමනය කළ ක්‍රියා මාර්ග 2ක් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) පුනරුද සමයේදී සාහිත්‍ය දියුණුව උදෙසා කටයුතු කළ මානවවාදී ගත් කතුවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ශාස්ත්‍රීය නවෝදය ඉතාලියෙන් ආරම්භ වීමට බලපෑ හේතු 2ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පුනරුදය සමඟ ලොවට නව විද්‍යාත්මක සොයා ගැනීම් ඉදිරිපත් කළ පුද්ගලයන් දෙදෙනෙකු පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) එංගලන්ත පාර්ලිමේන්තුවේ ප්‍රධාන මණ්ඩල දෙක හැඳින්වූ නම් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) මැග්නාකාර්ටා ගිවිසුමේ කොන්දේසි දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ඉංග්‍රීසි විප්ලවයේ වැදගත් ප්‍රතිඵල දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(07) (i) ප්‍රංශ විප්ලවයට පදනම් වූ සංකල්ප දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ප්‍රංශ විප්ලවය ඇතිවීමට හේතු වූ කරුණු දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) කාර්මික විප්ලවය කෘෂිකාර්මික ක්ෂේත්‍රයට බලපෑ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)